ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

මාධ්‍ය නිවේදනය

<u>ඉන්දිය නිවාස ව්‍යාපෘතිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ නව නිවාස ඒකක ඉදිකිරීම සඳහා මුල්ගල් තැබේ</u>

බදුල්ල දිස්ත්‍රික්කයේ අලගොල්ල වතුයායේ නව නිවාස ඒකක 51ක් ඉදිකිරීම සඳහා මුල්ගල් 2026 සැප්තැම්බර් 29 වන දින මහනුවර සහකාර මහ කොමසාරිස් සරණ්‍යා වී. එස්. මහත්මිය, ශ්‍රී ලංකාවේ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මැතිතුමා සහ නියෝජ්‍ය අමාත්‍ය ගරු ප්‍රදීප සුන්දරලිංගම් මැතිතුමා විසින් තබන ලදී.

2. මමෙ නිවාස ඒකක ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ සිව්වන අදියරේ දවෙන පියවර යටතේ ඉදි කරෙේ. මමෙ පියවර ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් 2025 ඔක්තෝබර් මාසයේදී දියත් කරන ලදී. සිව්වන අදියර යටතේ ශ්‍රී ලංකාවේ පළාත් 6ක වතු කම්කරු ප්‍රජාව සඳහා නිවාස 10,000ක් ඉදි කිරීමට සැලසුම් කර ඇත.

3. ඉන්දිය රජය විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රමුඛතම සංවර්ධන මූලපිරීමක් වන ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය යටතේ ඉන්දියානු රුපියල් බිලියන 18කට අධික ප්‍රදාන හරහා නිවාස 60,000ක් පමණ ඉදි කරෙේ. පළවන අදියර දකෙ යටතේ උතුරු සහ නැගෙනහිර පළාත් දකෙෙහි නිවාස 46,000ක් ඉදිකර හෝ අලුත්වැඩියා කර ඇති අතර තවෙන අදියර යටතේ වතුකර ප්‍රදේශවල නිවාස 4,000ක් ඉදිකර ඇත.

4. ශ්‍රී ලංකාව සමඟ ඉන්දියාවේ සංවර්ධන සහයෝගිතා හවුල්කාරිත්වය තුළ ඉන්දිය සම්භවයක් සහිත දමෙළ ප්‍රජාව සහ වතුකර ප්‍රදේශයන්ට වැදගත් ස්ථානයක් හිමි වේ. නිවාසවලට අමතරව සිදු කර ඇති සුවිශේෂී මූලපිරීම් අතරට දික්ෂය ඉදි කළ බහු විශේෂ රෝහල, සුහුරු පන්ති කාමර ස්ථාපනය කිරීම, වතුකර පාසල් නවයක් වැඩිදියුණු කිරීම සහ සීතා එළිය කෝච්චිල සඳහා ඉන්දිය සහය ලබා දනෙ බවට නිවේදනය කිරීම යනාදිය ද ඇතුළත් වේ. තවද අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් 2023 ජූලි මාසයේදී ඉන්දිය සම්භවයක් සහිත දමෙළ ප්‍රජාව ශ්‍රී ලංකාවට පැමිණ වසර 200ක් සපිරීම නිමිත්තනේ ඉන්දියානු රුපියල් මිලියන 750ක බහු ආංශික පැකේජයක් ද නිවේදනය කරන ලදී.

5. මමෙ වැඩසටහන සඳහා වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, වැව්ලි මානව සංවර්ධන භාරයේ නියෝජිතයන් සහ අලගොල්ල වතුයායේ නිවාස ප්‍රතිලාභීන් ඇතුළු රැසක් සහභාගී වූහ.

****

කොළඹ
2026 සැප්තැම්බර් ***29***